*සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය*
*පස්වැනි කලාපය, ප්‍රථම භාගය, 2010 ජනවාරි , 175-190*
*ISSN 1800-1459*

# බෞද්ධ දර්ශනයේ භාෂා අධ්‍යයන චින්තනය

**විමල් හේවාමානගේ**

*සිංහල අංශය, පාලි හා බෞද්ධ අධ්‍යයන ඒකකය, කොළඹ විශ්වවිද්‍යාලය, කොළඹ .3.*

**සාරාංශය**

**අනුසාසනා පාටිහාරිය** උසස් බව අගය කරන බුදුසමය ඉන්ද්‍රිය වර්ගීකරණයේ දී කාය, වචී හා චිත්ත ලෙස ඉන්ද්‍රිය තුනක් ඉදිරිපත් කරන අතර එහි වචනය වෙනම ම අවධාරණය කෙරේ. ආර්යඅෂ්ටාංගික මාර්ගයෙන් **සම්මාවාචා** නියෝජනය කරනුයේ භාෂාවේ භාවිතය යි. බුදුන් වහන්සේගේ භාෂාවට අදාළ ගුණ හා අගතනතුරු ප්‍රදානයේ දී භාෂාව හා බද්ධ තනතුරු ද අවධානයට ලක්විය යුතු ය. ප්‍රාග් බෞද්ධ භාරතීය භාෂා විග්‍රහයේ නිරුක්ති හා ව්‍යාකරණ යැයි ප්‍රධාන අංශ දෙකක් වූ අතර ඒවා භාරතීය දර්ශනයේ ප්‍රමුඛ සංකල්ප වන පුද්ගලාත්ම හා ජගදාත්ම සමඟ බැඳේ. භාෂාව හැඳින්වීමට බුදුසමයේ භාවිත යෙදුම්වලින් ප්‍රකටවන්නේ භාෂාව පොදු එකඟතාවක් හෙවත් සම්මුතියක් බව යි. බුදුසමය භාෂාව සලකන්නේ පර්යායත්වයෙනි. භාෂාව පරම අංශුන්ට විග්‍රහ නොකළත් එහි සියුම් වෙනස්කම් දැක්වීමට වචනයක කාලය, භාවිත පරිසරය වැනි විවිධ අංග සැලකිල්ලට ගෙන තිබේ. පශ්චාත් කාලීන බුදුසමයෙහි සම්මුති පරමත්ථ භේදය ඉස්මතු වී ඇත්තේ මෙය තහවුරු කිරීම පිණිස බව පෙනේ.

භාෂාවෙන් යථාර්ථය ප්‍රකාශ කළ හැකිමුත් ශ්‍රාවකයාට එය අවබෝධ කර ගැනීම පිළිබඳ ගැටළු පැන නැගිය හැකි බව බෞද්ධ විග්‍රහය යි. භාෂාව මනෝවිද්‍යාත්මක පදනමකින් ප්‍රභව වන බව සැලකිල්ලට ගෙන ඇති අතර සකායනිරුක්තියෙන් බුද්ධවචනය හැදෑරීමට ද අවසර දී තිබේ. **සම්මාවාචා** යටතේ භාෂාව හා බද්ධ වූ විරතිසමාදාන යන උභයාංශය ම සාකච්ඡා කෙරෙන අතර එහි සාත්ථ හා සබ්‍යඤ්ජන ද අන්තර්ගත වේ. බුදුසමය අසත්‍යය අගය නොකරන අතර ම සත්‍යයට ද වඩා සමාජ යහපත භාෂා භාවිතයෙහි ලා අපේක්ෂා කෙරෙන්නේ භාෂාව සාමයට මාර්ගයක් සේ ද සැලකිය හැකි බැවිනි.

යථෝක්ත කරුණු අනුව භාෂාව සහ එහි භාවිතය පිළිබඳ නවීන යුගයට ද ගැළපෙන බොහෝ වැදගත් ඉගැන්වීම් රැසක් බෞද්ධ දර්ශනයේ භාෂා අධ්‍යයන චින්තනය තුළ දැක ගත හැකි බව පැහැදිලි වේ.

**කේන්ද්‍රීය වචන:** අනුසාසනා පාටිහාරිය, සකායනිරුක්ති, ජනපදනිරුක්ති, අරණවිභංග, සම්මාවාචා

## හැඳින්වීම

බුදුසමය දර්ශනයක් ද ආගමක් ද යන ප්‍රස්තුතය දීර්ඝ කාලයක් විද්වතුන් අතර සංවාද ඇති කරන ලද මාතෘකාවකි. බුදුසමය, විශේෂයෙන් ත්‍රිපිටකය හුදු ආගමික ඉගැන්වීමක් ලෙස සලකනවාට වඩා එහි දාර්ශනික අගය විමර්ශනය කිරීම අනාගත ලෝකයාට බෙහෙවින් ඵලදායී විය හැක. බුදුසමය භාෂාව සම්බන්ධයෙන් දක්වන විග්‍රහය හුදු ආගමික විග්‍රහයක් පමණක් ද? එය භාෂාව පිළිබඳ නව විග්‍රහයන්ට කෙතෙක් දුරට ගැළපේ ද? හා එම ඉගැන්වීම් කෙතෙක් දුරට ප්‍රායෝගික උපයෝගිතාවෙන් යුක්ත ද?

යන ප්‍රස්තුත විමර්ශනය කිරීම මෙහි මූලික අභිප්‍රාය වන්නේ ය. සාහිත්‍යය පදනම් කර ගත් මේ පර්යේෂණ ලිපිය සඳහා පාලි ත්‍රිපිටකය ප්‍රධාන මූලාශ්‍රය ලෙස භාවිත කෙරෙන අතර එහි අර්ථකථන සඳහා තදනුබද්ධ අට්ඨකථා ද පරිශීලනය කරනු ලැබේ. උක්ත කරුණු අවබෝධ කර ගැනීම පිණිස බුදුසමයේ භාෂාවට හිමි ස්ථානය, ප්‍රාග් බෞද්ධ භාෂා විග්‍රහය, භාෂාව සඳහා නිර්දිෂ්ට පද, භාෂාව සහ යථාර්ථය, කාල භේදය, භාවිත පරිසරය සහ භාෂා භාවිතයට උපදෙස් යන අනුමාතෘකා කිහිපයක් යටතේ කරුණු පෙළගැස් වේ.

භාෂාව යනු කුමක් දැයි ගවේෂණය කිරීම භාෂා ඉතිහාසයේ අනවරත පරිශ්‍රමයක් සේ හැඳින්විය හැකි ය. භාෂ් (ව්‍යක්ත වචන) ධාතුවෙන් නිෂ්පන්න භාෂා යන පදය කෘදන්ත නාමයකි. එය ව්‍යක්ත ලෙස බිණීම හෙවත් කථා කිරීම යන අර්ථයෙහි යෙදේ. භාෂා යන්න වාච් / වාක් / වාග් යන්න හා සමානාර්ථවත් ව යෙදෙන අතර වච් ධාතුව ද ව්‍යක්ත වචනාර්ථයෙහි යෙදීම එය තව දුරටත් සනාථ කරයි. භාෂා යන්නට නිරුක්ති දක්වූ පැරණි භාරතීය නෛරුක්තිකයන් විසින් 'භාෂතෙ අනයෙති භාෂා' මෙයින් කථා කෙරේනුයි භාෂා නම් වන බව දක්වා තිබේ (බලගල්ලේ, 1995: 1, 2 පිටු). භාෂාව හා සම්බන්ධ භාෂණ යන භාව කෘදන්ත රූපය බිණීම, කථා කිරීම යන අර්ථවල යෙදේ.

ඉංග්‍රීසි භාෂාවේ මධ්‍යතන යුගයේ සිට භාවිත කෙරෙන language යන්න පැරණි ප්‍රංශ langage යන රූපයෙන් බිඳ ගත්තක් වන අතර එය ද ලතින් භාෂාවේ lingua යන රූපයෙන් බිඳගන්නා ලද්දකි. අපරදිග නිර්වචන අතුරින් Encyclopedia of Britannica ys Language යටතේ පළකළ ලිපියෙහි "Language is a system of conventional spoken or written symbols, by means of which human beings as members of a social group and participants in its culture, communicate." (Encyclopedia of Britanca, 1970: 697, 98) යන නිර්වචනය බෙහෙවින් අගය කළ යුතු ය. එහි ලෝක සම්මතය, පිළිවෙළ, භාෂණය, ලේඛනය හා සංඥා යන අංශ පිළිබඳ විශේෂ අවධානය යොමු කොට ඇති අතර ඒවා වැඩිදුරටත් විස්තර කර තිබේ.

භාෂා ඉතිහාසය පරීක්ෂා කරන විට පැහැදිලි වන්නේ භාෂාව පිළිබඳ විවිධ නිර්වචන කලින් කල ඇතිවූ අතර ඒ පිළිබඳ විශේෂ පොදු එකඟතාවක් දක්නට නොලැබෙන බව යි.

## භාෂාවට හිමි ස්ථානය

දිනක් බුදුන් වහන්සේ වෙත පැමිණි කේවඩ්ඪ නම් තරුණ මානවකයා නාලන්දා නගරයෙහි බොහෝ ධනවතුන් වාසය කරන බැවින් ඔවුන්ගේ පැහැදීම පිණිස ඍද්ධිප්‍රාතිහාර්ය පාන ලෙස බුදුන් වහන්සේගෙන් ඉල්ලා සිටියේය. ඔහුගේ ඉල්ලීම තෙවරක් ම ප්‍රතික්ෂේප කළ බුදුන් වහන්සේ ප්‍රාතිහාර්ය තුනක් පිළිබඳ ඔහුට කියා දුන්හ. එනම්

1. ඍද්ධි ප්‍රාතිහාර්ය (පුදුමයට පත් කිරීම)
2. ආදේශනා ප්‍රාතිහාර්ය (අනුන්ගේ සිත් දැන ගැනීම)
3. අනුශාසනා ප්‍රාතිහාර්ය (කරුණු කියා දී අවබෝධ කරවීම)

(දීඝනිකාය 1, 1962: 484488 පිටු) යනුවෙනි. උක්ත ප්‍රාතිහාර්යත්‍රයෙන් මුල් දෙක ම ප්‍රතික්ෂේප කළ බුදුන් වහන්සේ අනුශාසනා ප්‍රාතිහාර්ය පමණක් අගය කරන බව පැහැදිලි කළහ. අනුශාසනා ප්‍රාතිහාර්ය සිදුවන්නේ භාෂා මාධ්‍යයෙන් බව වැඩි දුරටත් පැහැදිලි කළ යුතු නොවේ.

බුදුසමයේ නිර්දිෂ්ට ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි ශීල ශික්ෂාව සම්පූර්ණ වීම සඳහා සම්මාවාචා වැඩිය යුතු ය. මුසාවාදා, ඵරුසාවාචා, පිසුණාවාචා, සම්පප්ඵලාපා යනු භාෂාව භාවිත විවිධ අවස්ථා ය. මේ පිළිබඳ පසුව සාකච්ඡා කරනු ලැබේ. පුද්ගල ඉන්ද්‍රිය කාය, වාක් හා මනෝ ලෙස වර්ග කරන බුදුසමය වාග් ඉන්ද්‍රිය කායේන්ද්‍රියෙහිලා නොසලකා අනන්‍ය ඉන්ද්‍රියයක් ලෙස අවධාරණය කර තිබේ. ඉන් කායික හා මානසික ක්‍රියාවන්ට සමාන තැනක් වාචසික ක්‍රියාවන්ට ද බුදුසමයේ හිමි වන බව ස්ඵුට කෙරේ.

බුදුරදුන්ගේ ගුණ අගය කරන සෝණදණ්ඩ බ්‍රාහ්මණයා උන් වහන්සේ සතු භාෂාව හා බැඳුණු ගුණ රැසක් ද ඇගයීමට ලක් කොට තිබේ. බුදුරජ කලණවදන් ඇත්තේය **(කල්‍යාණවාචො)**.කලණවදන් කරන්නේය **(කල්‍යාණවාක්කරණො)**. ශිෂ්ට වචනයෙන් යුක්ත වූවේ ය **(පොරියා වාචාය සමන්නාගතො)**. නිර්දෝෂී වදන් ඇත්තේ ය **(විස්සට්ඨා)**. කෙලතොලු නොවූවේ ය **(අනෙළගලාය)**. පැමිණීම මැනවැ යි කියන්නේ ය **(එහි ස්වාගතවාදී)**. කණට සුව එළවන වදන් ඇත්තේ ය **(සඛිලො)**. පිළිසඳරෙහි දක්ෂ ය **(සම්මොදකො)**. බැම නොහකුළුවන්නේ ය **(අබ්භාකුටිකො)**. උඩුකුරු කළ මුව ඇත්තේ ය **(උත්තානමුඛො)**. අරුත් හැඟවීමට සමත් ය **(අත්ථස්ස විඤ්ඤාපනියා)**. (දීඝනිකාය 1, 1962: 230 පිට) මෙහි දැක්වෙන අබ්භාකුටික වැනි අංග නූතන ලොකයේ ඉගැන්වෙන කායික භාෂාව (body language) හා සම්බන්ධ වේ. උන්වහන්සේගේ භාෂාව අර්ථය හා ශබ්දය යන උභයාංශය ම සැලකිල්ලට ගත් භාෂාවක් බව මෙයින් පෙනේ.

භාෂාව පිළිබඳ බුදුන් වහන්සේ උද්‍යෝගයක් දැක්වූ බවට තවත් සාධකයක් ලෙස අංගුත්තරනිකායේ එතදග්ගපාළිය දැක්විය හැකි ය. එහි දැක්වෙන ආකාරයට මිහිරි ස්වර ඇත්තවුන් අතර ලකුණ්ටකභද්දිය තෙරුන් වහන්සේ ද, සිංහනාද පවත්වන්නවුන් අතර පිණ්ඩෝලභාරද්වාජ තෙරුන් වහන්සේ ද, ධර්ම කථිකයන් අතර පුණ්ණමන්තානිපුත්ත තෙරුන් වහන්සේ ද, සවිස්තර කථිකයන් අතර මහාකච්චාන තෙරුන් වහන්සේ ද, විචිත්‍ර කථිකයන් අතර කුමාරකස්සප තෙරුන් වහන්සේ ද, කලණ බස් තෙපලන්නවුන් අතර සෝණකුටිකණ්ණ තෙරුන් වහන්සේ ද, පිළිසිඹියා පත්වූවන් අතර මහාකොට්ඨිත තෙරුන් වහන්සේ ද, ධර්මකථිකාවන් අතර ධම්මදින්නා තෙරණිය ද අග්‍රස්ථානයට පත් කොට තිබේ (අඞ්ගුත්තරනිකාය 1, 1960: 4650) මිහිරි

ස්වරය භාෂණයේ අංගයක් මිස නිවනට අත්‍යවශ්‍ය අංගයක් නොවේ. එහෙත් මිහිරි ස්වරය අගතනතුරක් ලැබීමට තරම් ඇගයීමකට ලක් වන්නේ සන්නිවේදන ක්‍රියාවලියේ දී භාෂාව බෙහෙවින් ඇගයීමකට ලක් වන බැවිනි. යථෝක්ත සියලු තනතුරු බැඳී තිබෙන්නේ භාෂාව සමග බව මොනවට පැහැදිලි වේ.

## ප්‍රාග් බෞද්ධ විග්‍රහය

මහාචාර්ය කලුපහනට අනුව ප්‍රාග් බෞද්ධ භාරතීය භාෂා විග්‍රහයෙහි නිරුක්ති හා ව්‍යාකරණ ලෙස ප්‍රධාන අංශ දෙකක් පැවති බව පැහැදිලි කෙරේ. නිරුක්ති යනු පදයක් විග්‍රහ කොට අවිපරිණාමී අනක්ෂර පරමාණුව කරා ගමන් කිරීම යි. එය පුද්ගලාත්මය හා බැඳේ. ව්‍යාකරණ යනු පද අතර අන්‍යෝන්‍ය සම්බන්ධය යි. එය විශ්වාත්ම, බ්‍රහ්ම හෝ ජගදාත්ම ලෙස සැලකිය හැකි ය. මක්නිසා ද යත් චතුර්වර්ණවල අන්‍යෝන්‍ය සම්බන්ධය දක්වන්නේ බ්‍රහ්ම විසින් බැවිනි. (Kalupahana, 1999: 5-6) භාරතීය දාර්ශනික ප්‍රවාහයෙහි ආත්ම සංකල්පය තරම් වැදගත් හා මුල් බැසගත් වෙනත් කිසිදු සංකල්පයක් නොවී ය. එතරම් උග්‍ර ලෙස මුල් බැස ගත් සංකල්පයකින් භාෂාව පිළිබඳ විග්‍රහය විනිර්මුක්ත වීම අපේක්ෂා කළ නො හැක්කකි.

## බෞද්ධ විග්‍රහය

භාෂාවේ අවයව හා භාෂාව හැඳින්වීම සඳහා භාවිත තනි පද හා පූර්වපද (prifix) හෝ පරපද (suffix) යොදා සකස් කර ගත් විශේෂ පද සූත්‍රයන්හි දක්නට ලැබේ. සද්ද (ශබ්ද) අක්ඛර (අක්ෂර) වචන (වචන) අධිවචන, වෙචන (පර්යාය පද) සංඛාර, පඤ්ඤත්ති, ධම්ම (සංකල්ප) නාම (නම්) අධිවචනපථ (පර්යායන්ගේ මාර්ගය) පඤ්ඤත්තිපථ (ප්‍රකාශන මාර්ගය) ලෝකසාමඤ්ඤ (ලෝකය හා සම්බන්ධ සාමාන්‍යය) ලෝකනිරුත්ති (ලෝකයෙහි නිරුක්තිය) ලෝකවොහාර (ලෝකයෙහි ව්‍යවහාරය) ලෝකපඤ්ඤත්ති (ලෝකයෙහි ප්‍රකාශනය) ජනපදනිරුත්ති (ජනපද නිරුක්තිය) සාමඤ්ඤ (පොදු ව්‍යවහාරය) සම්මුති (සම්මුතිය) වැනි රූප එහි ලා දක්නට ලැබේ (Kalupahana, 1999: 48).

මෙහි දැක්වෙන ලෝක සාමඤ්ඤණ ලෝකනිරුත්ති, ලෝකවෝහාර, ලෝකපඤ්ඤත්ති, සාමඤ්ඤ සම්මුති වැනි යෙදුම්වලින් ප්‍රකට වන්නේ භාෂාව පොදු එකඟතාවක් බව යි. එහෙත් එම එකඟතාව සර්ව සාධාරණ වූවක් නොවේ. සමස්තයක් වශයෙන් පොදු එකඟතාවක් නොමැති නම් භාෂාව හැඳින්වීමට සම්මුති (එක්ව සිතීම) යන වචනය යෙදිය නොහැකිවාක් මෙන් ම අදහස් හුවමාරු කර ගැනීමට ද හැකියාවක් ද නොලැබේ. පොදු එකඟතාවේ දී සිදුවනුයේ ස්වකීය පෞද්ගලික අනුභූතියෙහි සුවිශේෂතා අමතක කොට පොදු පිළිගැනීමට එකඟවීම යි. නිදසුනක් ලෙස සුනඛයා යන වචනය සැලකිල්ලට ගන්න. බල්ලා පිළිබඳ එක ම නිවසක වසන සීයා, අම්මා හා දුව යන පරම්පරා තුන ම සිංහල බසෙහි බල්ලා යන වදනින් හඳුනා ගන්නා පොදු ලක්ෂණ ඇති අතර එකිනෙකාගේ අනුභූතියට සාපේක්ෂක විශේෂ ලක්ෂණ ද දක්නට ලැබේ. එම විශේෂතාව තුළ සීයාට බල්ලා ආරක්ෂකයෙකු, අපිරිසිදු සතෙකු ලෙස

පෙනේ. අම්මාට ආරක්ෂකයෙකු හා දුවගේ සුරතල් සතා ලෙස බොහෝදුරට පෙනේ. කුඩා දරුවාට බල්ලා තම ක්‍රීඩා සහායකයා, සුරතලා බවට පත් වේ. එසේ වුවත්, 'බල්ලාට කෑම දුන්නා ද?' යන වැකිය කණ වැකෙත් ම එම වදන් පෙළගැසී ඇති ආකාරයෙන් භාවිත මූලික අර්ථය සියලු දෙනා අවබෝධ කර ගනිති.

රස සම්බන්ධ තත්වය ද මෙසේ ය. අප විසින් ලුණු රස, පැණි රස ලෙස භාවිත කරන රස විශේෂයන්හි විවිධතා ඇතත් 'මේක ලුණු රස යි' යන්නෙන් හැඳින ගන්නා පොදු අනුභූතියට සියලු දෙනා එකඟ වෙති. එහෙත් ඒ අතර විවිධතා පවතින බව පෙනේ.

භාෂාව සහ යථාර්ථය පිළිබඳ සාකච්ඡාව ද මීට සම්බන්ධ බැවින් මෙහි දී විමර්ශනය කිරීම යෝග්‍ය යැයි හැඟේ. නිර්වාණය පිළිබඳ නිකෙලෙස් උතුමන්ගේ ප්‍රකාශන ථේරගාථා, ථේරීගාථා වැනි කෘතීන්හි සෘජු ව ම සංග්‍රහ වී තිබේ. රහතන් වහන්සේලා සහ රහත් තෙරණින් වහන්සේලා ලද ස්වකීය අනුභූතීන් එහි දක්නට ලැබේ. තමන්ගේ පුත්‍රයා වූ අභය තෙරුන්ගේ උපදෙස් පිළිපදිමින් වාසය කළ අභයමාතා තෙරණිය.

'මම සියලු රාග දුරු කළෙමි. කෙලෙස් පරිදාහ සම්පූර්ණයෙන් සින්දෙමි. සිසිල් වූවෙමි. නිවුනෙමි'

'එවං විහරමානාය සබ්බො රාගො සමූහතො
පරිළාහො සමුච්ඡින්නො සීතිභූතාම්හි නිබ්බුතා' (ථේරීගාථා, 1972: 14)

යනුවෙන් කරන ප්‍රකාශය ස්වකීය ආනුභූතික වූ නිවන පිළිබඳ ප්‍රකාශනයකි. ඇය භාවිත කරන්නේ පොදු ව්‍යවහාරය වුව ද එහි අර්ථය ශ්‍රාවකයාට එලෙසින් ම ග්‍රහණය කර ගැනීමට නොහැක. එසේ වුවත් ඒ පිළිබඳ මූලික හැඳින ගැනීමකට එය ප්‍රමාණවත් බව පෙනේ. 'සිසිල් වූයෙමි' යන වදන සාමාන්‍ය පුහුදුන් සමාජයේ නිත්‍ය ස්වභාවය වූ උණුසුම් බවට විරුද්ධාර්ථ යි. පාලියේ **'නිබ්බුත'** යනු නිවුණු යන අර්ථ ඇති අතීත කෘදන්ත රූපයකි. නිවුණු යන අර්ථය ද සාමාන්‍ය පුහුදුන් ස්වභාවය වන දැල්වීමට හෙවත් පත්තුවීමට විරුද්ධාර්ථ ය. එම වචන ඇසෙත් ම ශ්‍රාවකයා එම අත්දැකීම ස්වකීය අනුභූතියට සාපේක්ෂක ව කල්පනා කොට අවබෝධ කර ගනී. පෙර දැක්වූවාක් මෙන් ම මේ භාෂිතය හා ශ්‍රැතිය අතර සර්ව සම්පූර්ණ එකඟතාවක් ඇතැයි කිව නොහැකි වුව ද එහි මූලික අර්ථය අවබෝධ කර ගැනීමට බාධාවක් නොවේ. උදායි රහතන් වහන්සේ වීතරාග, වීතදෝස, වීතමෝහ, අනාසව යන රූප නිර්වාණය පිළිබඳ ස්වකීය අනුභූතිය පැහැදිලි කිරීමට යොදා ගෙන තිබේ (වීතරාගො වීතදොසො වීතමොහො අනාසවො). (ථේරගාථා, 1972( 184 ) බුදුන් වහන්සේ ද බොහෝ අවස්ථාවන්හි නිවනෙහි ස්වරූපය පැහැදිලි කිරීම සඳහා අජාත, අභූත, අකත, අසංඛත වැනි නිෂේධාර්ථවත් පද භාවිත කොට තිබේ.

යථාර්ථය භාෂාව මගින් ප්‍රකාශ කළ හැකි බව අභිධර්මයෙහි විග්‍රහ වන පඤ්ඤත්ති විභාගය තුළින් ද අවධාරණය කෙරේ. අභිධර්ම විග්‍රහයට අනුව අත්ථපඤ්ඤත්ති හා නාමපඤ්ඤත්ති යැයි පඤ්ඤත්ති විභාගය දෙවැදෑරුම් වන අතර අත්ථපඤ්ඤත්තියෙන්

අර්ථය හෙවත් අදහස් ද නාමපඤ්ඤත්තියෙන් ශබ්දය හෙවත් වචන ද නියෝජනය කෙරේ. එසේ ම එම පඤ්ඤත්ති ද්වය ථේරවාද අභිධර්මයෙහි මූලික සංකල්පයක් වන සම්මුති හා පරමත්ථභේදය සමග ද සම්බන්ධ කෙරේ. ඒ අනුව අත්ථ පඤ්ඤත්ති යන්නෙන් සම්මුති සත්‍යය ද නාම පඤ්ඤත්තියෙන් සම්මුති හා පරමාර්ථ යන උභය සත්‍යයන් ම ද අදහස් කෙරේ (Sumanapala, 1998: 41).

ශබ්ද හෙවත් වචන මගින් නිර්වාණය ප්‍රකාශ කළ හැකි මුත් ශ්‍රාවකයා එහි අර්ථය වටහා ගන්නේ අර්ථප්‍රඥප්තියෙන් නොවේ. මක් නිසා ද යත්, ශ්‍රාවකයා නිවන අවබෝධ කර නොගත්තෙකු නම් ඔහු නිවන පිළිබඳ ප්‍රකාශනය ග්‍රහණය කර ගනුයේ ස්වකීය අනුභූතීන්ට සාපේක්ෂක ව බැවිනි. එසේ ම බුදුසමයෙහි නිර්දිෂ්ට නිවන වැඩියයුතු' **(භාවෙතබ්බ),** ආර්ය අෂ්ටාංගික මාර්ගය නම් ආචාරාත්මක ප්‍රතිපදාවේ ඵලයකි. එබැවින් බෞද්ධ විමුක්ති සාධනයට එම ආචාරාත්මක ප්‍රතිපදාව පිරිය යුතු ය. එහෙත් සම්මුති සත්‍යය වචන වශයෙන් මෙන් ම අදහස් වශයෙන් ද අවබෝධ කර ගත හැකි ය.

**අධිවචන, වෙවචන, පරියාය, ජනපදනිරුක්ති** යන පද භාෂාව හැඳින්වීමට යොදන විට එය පර්යායත්වයෙන් සැලකේ. බුදුන් වහන්සේගේ දේශනය පර්යාය දේශනයක් බව උන්වහන්සේ ම පැහැදිලි කළහ. මේ සඳහා ඉතා පැහැදිලි නිදසුනක් මජ්ඣිමනිකායේ අරණවිභංග සූත්‍රයෙහි දක්නට ලැබේ. ඒ අනුව පාත්‍රය හැඳින්වීම ඒ ඒ ජනපදවල නිර්දිෂ්ට රූප හතක් දක්නට ලැබේ. පත්ත, පාති, විත්ථි, සරාව, ධාරොප, පොණ, පිසිල යනු එම රූපයෝ ය. බුදුන් වහන්සේ මේ රූපයන්හි වෙන් වෙන් වූ අර්ථය හෝ ඉන් වඩාත් යෝග්‍ය රූපය සෙවීමට උත්සාහ ගෙන නැත. උන්වහන්සේ පැහැදිලි කරන්නේ එය භාවිත අර්ථය තේරුම් ගැනීමට උපයෝගී කර ගන්නා ලෙස යි. ඒ අනුව පර්යාය රූප සහිත භාෂාවක එක් රූපයක් පමණක් භාවිත කළ යුතු බවට කෙරෙන නීතියක් බුදුසමය නිර්දිෂ්ට නොකරයි. නැතහොත් එක් ජනපදයක භාවිතයට වඩා අනෙක් ජනපද රූපය උසස් කොට හෝ පහත් කොට නොසැලකේ. එහෙත් සාමාන්‍ය ව්‍යවහාරය නොඉක්ම වන ලෙසත් ජනපද නිරුක්තියෙහි දැඩිව නොඇලෙන ලෙසත් වැඩිදුරටත් උපදෙස් දී තිබේ. අරණවිභංග සූත්‍රයෙහි උක්ත කරුණට අදාළ පාලි ඡේදයෙහි අනුවාදයක් පහත දැක්වේ.

"ජනපද නිරුක්තියෙහි අභිනිවේශ නොකරන්නේ ය. ලෝක ප්‍රඥප්තිය නොඉක්මවන්නේ ය. මෙසේ කියන ලද්දේ කුමක් පිණිස ද? මහණෙනි කෙසේ ජනපද නිරුක්තියෙන් අභිනිවේශ වෙයි ද ලෝක ව්‍යවහාරයාගේ ඉක්මීම වෙයි ද මහණෙනි මෙහි බඳුන ඇතැම් ජනපදයෙක පාතී යැයි හඳුන්වති. ඇතැම් ජනපදයෙක පත්ත හඳුන්වති. ඇතැම් ජනපදයෙක විත්ථ යැයි හඳුන්වති. ඇතැම් ජනපදයෙක සරාව යැයි හඳුන්වති. ඇතැම් ජනපදයෙක ධාරොප යැයි හඳුන්වති. ඇතැම් ජනපදයෙක පොණ යැයි හඳුන්වති. ඇතැම් ජනපදයෙක පිසිල යැයි හඳුන්වති. මෙසේ එම බඳුන ඒ ඒ ජනපදයෙහි යම් ආකාරයකින් හඳුන්වත් ද ඒපරිද්දෙන් දැඩි ව පරාමර්ශ කොට අභිනිවේශ කොට මෙය ම සත්‍ය ය අනෙක්වා හිස් යැ කියති. මෙසේ ජනපද නිරුක්තියෙහි අභිනිවේශය වෙයි. ලෝක ව්‍යවහාරයාගේ ඉක්ම යැම ද වෙයි (මජ්ඣිමනිකාය 3, 1974: 490491).

මීට අමතර ව පිසුණු බස් නොකීම ඉදිරියෙහි ද කිළිටි බස් නොබිණීම හා ත්වරිත නොවී බිණීම යන කරුණු ද සාකච්ඡා කොට තිබේ. ඒවා අරණධර්ම (යුද්දයට හේතු නොවන / සාමයට හේතු වන ධර්ම) වන ආකාරය ද සූත්‍රාවසානයෙහි පැහැදිලි කොට තිබේ (මජ්ඣිමනිකාය 3, 1974: 490494) පාලි නිඝණ්ඩු සාහිත්‍යයේ ද එවැනි පර්යාය පද එකතුවකි. භාෂාව පිළිබඳ බුදුන් වහන්සේගේ සුබනම්‍ය ප්‍රතිපදාව ද එම කෘති බිහිවීමෙහි ලා බලපාන්නට ඇතැයි සැලකිය හැකි ය.

මෙය වඩාත් පැහැදිලි කර ගැනීම පිණිස අප රටෙන් නිදසුනක් ගනිමු. අප රටෙහි පහතරට හා උඩරට භාෂා භාවිතයෙහි යම් යම් විෂමතා තිබේ. එහෙත් එහි අර්ථය තේරුම් ගැනීමට එහි බාධාවක් සිදු නොවේ. කුමට ද? කුමකට ද? මොකට ද? මොට ද? මක්කටෙයි? මක්කට ද? මක්කෙ? වැනි රූප රැසක් ප්‍රශ්නවාචී වාක්‍ය භාෂණයේ දී භාවිත වන අතර එහි අරමුණෙහි විවිධතාවක් දක්නට නොලැබේ. එහෙත් උගතුන් විසින් නිර්දිෂ්ට භාෂාව හුදු උඩ හෝ පහත භේදයක් සෘජු ව ඉස්මතු නොකෙරෙන අතර ඊට ම ආවේණික ලක්ෂණවලින් හා උක්ත සම්ප්‍රදාය දෙකින් ම උකහාගත් ලක්ෂණවලින් යුක්ත වේ.

පාලි භාෂාවෙහි දක්නට ලැබෙන රූප බාහුල්‍යය පිළිබඳ ව ද මෙහි ලා අප අවධානය යොමු කළ යුතු ය. නිදසුනක් ලෙස ඕකාරාන්ත **ගො** ශබ්දයෙහි තනි රූපයක් යෙදී ඇත්තේ **පඨමා** සහ **ආලපන** ඒකවචනයෙහි පමණි. ඉනිදු ආලපනය පඨමාවේම අවස්ථාවක් ලෙස සැලකේ. අනෙක් සියලු විභක්තීන්හි ඒකවචන බහුවචන දෙකෙහි ම රූප දෙකක් හෝ ඊට වැඩි ගණනක් දක්නට ලැබේ. **පඤ්චමී** ඒකවචනයෙහි **ගාවා, ගවා, ගාවම්හා, ගවම්හා, ගාවස්මා, ගවස්මා** යනුවෙන් රූප හයක් ද **සත්තමී** ඒකවචනයෙහි **ගාවෙ, ගවෙ, ගාවම්හි, ගවම්හි, ගාවස්මිං, ගවස්මිං** යනුවෙන් රූප හයක් ද ආදී ස්වර දීර්ඝව හා හ්‍රස්ව ව යොදා භාවිතයට ගැනේ. මෙම රූප බාහුල්‍යයට වෛදික සංස්කෘත රූපයන්හි බලපෑම මෙන් ම ප්‍රාදේශීය ව්‍යවහාරයන්හි **(ජනපද නිරුක්ති)** බලපෑම ද දක්නට ලැබේ. භාෂා පරිණාමයේ දී නැගෙනහිර ඉන්දීය හා බටහිර ඉන්දීය යන දෙකෙහි ම භාවිත රූපාභාසය පාලියෙහි දක්නට ලැබීම ද මෙහි ලා අවධානයට යොමු විය යුතු ය. මෙම රූප බාහුල්‍යය ආඛ්‍යාත වර නැගීම්හි ද විද්‍යමාන බව **අජ්ජතනී, හීයත්තනී** වැනි විභක්තීන් පරීක්ෂා කිරීමෙන් පැහැදිලි වේ.

සම්භාව්‍ය සිංහල ගද්‍යයෙහි ධර්ම දේශනා ශෛලිය අනුගමනය කරමින් රචිත සද්ධර්මරත්නාවලියෙහි උක්ත පර්යාය පද භාවිතය බහුල වශයෙන් දක්නට ලැබේ. වර්තමානයේ ද ධර්ම දේශක භික්ෂූන් වහන්සේලාගේ භාෂාවෙහි පර්යාය පද භාවිතය බහුල ව දක්නට ලැබීම උක්ත පර්යාය දේශනා ක්‍රමය දැන හෝ නොදැන අනුගමනය කිරීමක් සේ සැලකිය හැකි ය.

භාෂාව තේරුම් ගැනීමේ දී භාවිත පරිසරය ද සැලකිල්ලට ගත යුතු ය. අංගුත්තරනිකායේ දැක්වෙන නීතත්ථ හා නෙය්‍යත්ථ සූත්‍රයන්හි බුදුන් වහන්සේගේ දේශනය පැහැදිලි

කිරීම සඳහා **නීතත්ථ** හා **නෙයයත්ථ** වටහා ගත යුතු බවත් එය වරදවා විවරණය කිරීම බුදුන් වහන්සේ වැරදි ලෙස විවරණය කිරීමක් බවත් එහි දක්වේ (අඞ්ගුත්තරනිකාය 1, 1960: 118) භාෂාව භාවිත පරිසරය අනුව තේරුම් ගත යුතු බවට කෙරෙන ප්‍රකාශන භාෂාව පිළිබඳ නව අර්ථකථනයක් නොවේ. නීත යනු නී ධාතුවෙන් නිෂ්පන්න, පැමිණ වූ යන අර්ථ ඇති අතීත කෘදන්ත රූපයක් වන අතර නෙයය යනු එම ධාතුවෙන් ම නිෂ්පන්න, පැමිණ විය යුතු යන අර්ථ ඇති කිච්ච කෘදන්ත පදයකි. ඒ අනුව නීතත්ථ පැමිණ වූ අර්ථ ඇති හා නෙයයත්ථ පැමිණවිය යුතු අර්ථ ඇති ලෙස දක්විය හැකි ය. මින් පැහැදිලි කෙරෙන්නේ භාෂාවේ අවබෝධය භාවිත පරිසරය තුළ අර්ථවත් වන බව යි. එක ම වදන ඒ ඒ සන්දර්භය තුළ විවිධාර්ථ නිරූපණය කරයි. බෞද්ධ දර්ශනයෙහි ඉමහත් විමර්ශනයට ලක් කෙරෙන අත්ත, පුග්ගල, ධම්ම වැනි රූප ඊට අදාළ සන්දර්භය තුළ අවබෝධ කර ගත යුතු ය.

**අත්තුක්කංසන පරවම්භන** තමා උසස් කොට අනුන් පහත් කොට සැලකීම
**අත්තාහි අත්තනො නාථො** තමාට පිහිට තමා ම ය.

**යං දුක්ඛං අත්තං වා අනත්තං වා** යමක් දුක් නම් එය ආත්ම ද අනාත්ම ද?

**සො ලොකො සො අත්තා නිච්චො ධුවො සස්සතො අවිපරිනාම ධම්මො** ඒ ලෝකය ඒ ආත්මය නිත්‍ය ය ධ්‍රැව ය. ශාස්වත ය නොවෙනස් වන ධර්මයකි.

මෙහි භාවිත අත්ත ශබ්දය ඉතා පැහැදිලි ව අර්ථ දෙකක භාවිත වී තිබේ. පළමු අවස්ථා දෙකෙහි තමා යන අර්ථයෙහි ද ඊළඟ දෙකෙහි ආත්ම යන අර්ථයෙහි ද යෙදී තිබේ. බුදුන් වහන්සේගේ දේශනයෙහි ඇතුළත් මේ පදයන්හි අර්ථය භාවිත සන්දර්භය තුළ අවබෝධ කර ගත යුතු බව ඉන් ගම්‍ය වේ. පසුකාලීන ව ප්‍රභව වූ පුද්ගලවාද වැනි නිකායිකයන්ගේ ප්‍රභවයට ද පුද්ගල ශබ්දයෙහි භාවිතය වරදවා තේරුම් ගැනීම හේතු වී තිබේ. ධම්ම ශබ්දයෙහි පවත්නා විවිධතා විමර්ශනයට මහාචාර්ය ජෝන් රොස් කාටර්ගේ කෘතිය සපයන ආලෝකය බෙහෙවින් අගය කළ යුතු ය (කාටර්, 1999).

භාෂාව සම්බන්ධයෙන් පරම අංගුත්ට විග්‍රහ කිරීම බුදුන් වහන්සේගේ ප්‍රතිපදාව නොවූ නමුත් කාල භේදය වැනි සංකල්ප සැලකිල්ලට ගෙන තිබේ. ප්‍රාග් බෞද්ධ භාෂා විග්‍රහයෙහි භාවිත වූ කාලභේදය බුදුන් වහන්සේගේ නව දර්ශනය පැහැදිලි කිරීම සඳහා ප්‍රමාණවත් නොවූ බැවින් අතීත, වර්තමාන, අනාගත කාල භේදය වෙනුවට අතීත (ඉක්ම ගිය) පච්චුප්පන්න (දෙස බලා ඉපදුණු) අනාගත (මෙතෙක් නොපැමිණි) ලෙස වර්තමානය සඳහා නව අර්ථ කථනයක් ඉදිරිපත් කර තිබේ. බුදුන් වහන්සේ හා චිත්‍ර නමැත්තා අතර වන අතුරු සංවාදයක දී විය (අහොසි), වෙයි (හොති), වන්නේය (භවිස්සති)[1] යන කාලත්‍රය ම භාවිත කොට තිබේ. විධි ක්‍රියා ආශීර්වාද ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා ද පාලි ත්‍රිපිටකයෙහි දක්නට ලැබේ. බුදුන් වහන්සේගේ භාෂා දර්ශනයෙහි භාවිතය ධම්මචක්කප්පවත්තන සූත්‍රයෙහි ද දක්නට ලැබේ. එහි උපයෝගී කොට ගෙන ඇති පරිඤ්ඤෙය්‍යා, පරිඤ්ඤාත, පහාතබ්බ, පහීණ, සච්ඡිකාතබ්බ,

සච්ඡිකත, භාවෙතබ්බ, භාවිත (මහාවග්ගපාළි 1, 1957: 22) යන පද යුගල වශයෙන් පිළිවෙළින් චතුරාර්ය සත්‍යය හා සම්බන්ධ කෙරේ. ත්‍රිපරිවට්ට ද්වාදසාකරයට සම්බන්ධ මෙහි ඊට අදාළ දාර්ශනික යථාර්ථය මතු කෙරෙන ශබ්ද හා ඊට අදාළ රූප තෝරා ගෙන තිබේ.

පාලිය බුදුන් වහන්සේ විසින් භාවිත භාෂාව සේ සම්පූර්ණයෙන් නොපිළිගැනෙතත් එතුමන්ගේ ධර්මය සංගෘහීත පැරණි ම ලේඛනය පාලි ත්‍රිපිටකය බව අවිවාදයෙන් පිළිගැනේ. සංස්කෘත හා ඒ දෙස බලා සකස් කර ගත් ටිබෙට් හා චීන පරිවර්තන ඇතත් ඒවාට පාලි පෙළට තරම් ඓතිහාසිකත්වයක් හිමි නොවේ.

භාෂාව පිළිබඳ කෙරෙන විමර්ශනයක දී සකාය නිරුක්ති සංකල්පය ද අවශ්‍යයෙන් ම සැලකිල්ලට ගත යුත්තකි. දිනක් බුදුන් වහන්සේ වෙත පැමිණි යමෙලු තෙකුල යන බ්‍රාහ්මණ වංශික භික්ෂූන් වහන්සේලා දෙනම නානාගෝත්‍රයෙන් නානාජාතියෙන්, නානාකුලයෙන් පැමිණ පැවිදි වූ භික්ෂූන් වහන්සේලා සකාය නිරුක්තියෙන් බුද්ධ වචනය දූෂණය කරන බැවින් එය ආරක්ෂා කර ගැනීම පිණිස ඡන්දසට නැගීමට අවසර දෙන ලෙසත් ඉල්ලා සිටියහ. මෝඝපුරිස යන යෙදුමෙන් ඉල්ලීම කළ භික්ෂූන් දෙනම ඇමතූ බුදුන් වහන්සේ, එසේ කිරීම නොපැහැදුණවුන්ගේ පැහැදීමට හා පැහැදුණවුන්ගේ වැඩි පැහැදීමට හේතු නොවන බව පවසමින් ඉල්ලීම ප්‍රතික්ෂේප කොට බුද්ධ වචනය සකාය නිරුක්තියෙන් හැදෑරීම අනුමත කොට තිබේ (චුල්ලවග්ගපාළි 2, 1983: 100).

මෙහි ඡන්දස යනු වේදභාෂාව බව අවිවාදයෙන් පිළිගැනේ. **සකාය නිරුක්තිය** යනු මාගධික ව්‍යවහාරය බව අට්ඨකථාචාර්ය බුද්ධඝෝෂ මතය යි. ''සකායනිරුත්තියාති එත්ථ සකා නිරුත්ති නාම සම්මාසම්බුද්ධෙන වුත්තප්පකාරො මාගධකො වොහාරො'' (සමන්තපාසාදිකා 4, 1948: 897). අටුවාව අනුව යමින් බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාවේ ද සකාය නිරුක්තියෙන් බුද්ධවචනය හැදෑරීමට බුදුන් වහන්සේගේ අවසරය ඇතුළත් පාඨය මාගධික නිරුක්තියෙන් (චුල්ලවග්ගපාළි 2, 1983: 101 ) යැයි ද Pali Text Socity මගින් පළකළ අයි. බී. හෝනර්නගේ පර්වර්තනයේ own dialect' (තමන්ගේ භාෂාව) (Horner, 1975: 194) යැයි ස්ථාන දෙකෙහි ම පරිවර්තනය කොට තිබේ.

මෙය යෙදී ඇති සන්දර්භය පරීක්ෂා කිරීමේ දී අට්ඨකථා මතය සාවද්‍ය බව පෙනීයයි. උක්ත සන්දර්භයේ අවස්ථා දෙකක සකායනිරුත්ති යන්න යෙදී තිබේ. ඉන් එක් අවස්ථාවක් නම් භික්ෂූන් සකායනිරුක්තියෙන් බුද්ධවචනය දූෂණය කරන බැවින් බුද්ධවචනය ඡන්දසට නැගීමට බුදුරදුන්ගෙන් කළ ඉල්ලීම වන අතර දෙවැන්න එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරමින් බුද්ධ වචනය සකායනිරුත්තියෙන් හැදෑරීමට බුදුරදුන් අනුමත කරන අවස්ථාවයි. සකාය නිරුත්ති යනු මාගධ භාෂාව නම් සකායනිරුත්තියෙන්

බුද්ධ වචනය දූෂණය වන්නේ යැයි යමෙලු තෙකුල භික්ෂූන් දෙදෙනා කරන ප්‍රකාශනය කුමක් දැයි ගැටලුවක් මතු වේ. එසේ ගතහොත් භික්ෂූන් මාගධ ව්‍යවහාරයෙන් බුද්ධ වචනය දූෂණය කරති යි පූර්වෝක්ත භික්ෂු දෙනම කියති. ඉන්පසු බුදුන් වහන්සේ ඡන්දසට නැඟීම ප්‍රතික්ෂේප කොට මාගධ භාෂාවෙන් ධර්මය හැදෑරීමට අවසර දෙති. එක ම සන්දර්භයේ අවස්ථා දෙකෙහි පවා සකායනිරුත්ති යන්න මාගධ ව්‍යවහාරය සේ අර්ථ ගැන්වීමෙන් ගැටළු පැනනගින්නේ නම් එය මාගධික ව්‍යවහාරය සේ ගැනීම සම්ප්‍රදාය පමණක් අරක්ෂා කිරීමකි.

බුදුන් වහන්සේ භාෂාව සම්බන්ධයෙන් දක්වා ඇති නම්‍යශීලී ප්‍රතිපදාව පිළිබඳ අවධානය යොමු කිරීමෙන් පැහැදිලි වන්නේ බුද්ධ වචනය අධ්‍යයනය කිරීම එක් භාෂාවකට පමණක් සීමා කිරීම කිසිසේත් ම සිදුවිය නොහැක්කක් බව යි. ඒ අනුව මෙහි සකායනිරුත්ති යනු ස්වකීය භාෂාව බව පැහැදිලිව ප්‍රකාශ කළ හැකි ය. නවීන ලෝකයේ ද ස්වභාෂාවෙන් අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය විශේෂයෙන් ඇගයීමට ලක්වෙමින් පවතී. මහාවිහාරීය භික්ෂූන්ගේ අරමුණ වන්නට ඇත්තේ මාගධ හෙවත් පාලියට (මහාවිහාරීය පිළිගැනීම අනුව) වැඩි අවධානයක් හා වටිනාකමක් ඇති කර ගැනීම යි. සකායනිරුත්ති යනු මාගධවොහාර යැයි ගැනීම **සාමාගධී මූලභාසා** (සීලක්ඛන්ධවග්ග අභිනව ටීකා) වැනි මාගධිය අතිපෞරාණික මහාබ්‍රහ්මයා පවා කතා කළ භාෂාව සේ හැඳින්වීමට කළ උත්සාහයේ ආරම්භක අවධිය නියෝජනය කරන අවස්ථාවක් ලෙස සැලකිය හැකි ය.

## භාෂා භාවිතය

බුදුසමය වැඩි අවධානයක් දක්වන්නේ භාෂාවේ භාවිතය සම්බන්ධයෙනි. ඒහා බැඳුණු උපදෙස් රැසක් ත්‍රිපිටකයෙහි දක්නට ලැබේ. භාෂාවේ සාත්ථ හා සබ්‍යඤ්ජන බව බුදුසමය නොයෙක් තැන්හි දී අගය කොට තිබේ. එනම් අර්ථ සහිත බව හා ශබ්ද හෙවත් වචන සහිත බව යි. මෙහි සමතුලිත බව භාෂාව වඩාත් අර්ථපූර්ණත්වයට මෙන් ම මධුරත්වයට පත් කරයි. එහෙත් බුදුසමය වැඩි අවධානයක් යොමු කරන්නේ අර්ථ සහිත බව ආරක්ෂා කර ගැනීම පිණිස බව සූත්‍ර පරීක්ෂා කරන විට පෙනේ. ගීතස්වරයෙන් ධර්මය දේශනා නොකරන්නැයි[2] බුදුරදුන් කළ පැනවීම උක්ත අදහස තහවුරු කරන්නකි. දික් වූ හඬින් ධර්මය ගායනා කරන කල්හි ගායනා කරන්නා තමන්ගේ ම හඬෙහි ම ඇලීම, අන්‍යයන් ඒ හඬෙහි ම ඇලීම, ශ්‍රාවකයන් ලාමක කොට සිතීම, ගායනා කරන භික්ෂුවගේ චිත්ත සමාධිය බිඳවැටීම හා පශ්චිම ජනතාව දිට්ඨානුගතියට පැමිණීම යන ආදීනව පස ඇති කරන බව බුදුන් වහන්සේ පැහැදිලි කළහ (චුල්ලවග්ගපාළි 2, 1983: 12) ගීතස්වරයෙන් ධර්මය ගැයීමෙන් එහි ශබ්ද රසය මතු වන අතර අර්ථ රසය යටපත් වෙයි. එහි දී ධර්මයෙන් අපේක්ෂිත කාර්යාවලිය ඉටු නොවේ. නිගණ්ඨනාථපුත්තගේ අභාවයෙන් පසු නිගණ්ඨ ශාසනය තුළ ගැටුම් ඇති විය. එබැවින් බුදුන් වහන්සේගේ ශ්‍රාවකයන් තුළ ද අනාගතය පිළිබඳ යම් අවිනිශ්චිත බවක් ඇති වූ බව පෙනේ. එබැවින් භික්ෂූන් වහන්සේලාට එක්රැස් වී තමන් හා දෙවිමිනිසුන් සහිත ලෝකයාට හිත පිණිස සියලු දෙනා සමග ධර්මය සංගායනා කරන ලෙස හා විවාද නොකරන ලෙස බුදුන් වහන්සේ උපදෙස් දුන්හ (සබ්බෙහෙව සංගායිතබ්බං න විවදිතබ්බං) (දීඝනිකාය 3, 1976: 356).

පසුකාලීන පිරිත් ශාන්ති කර්මය සබ්‍යඤ්ජන පිළිබඳ වැඩි අවධානයක් යොමු කළ අවස්ථාවක් ලෙස සැලකිය හැකි ය. මීට අමතර ව ආරම්භය යහපත් (ආදිකල්‍යාණං), මැද යහපත් (මජ්ඣෙ කල්‍යාණං), කෙළවර යහපත් (පරියොසාන කල්‍යාණං), අර්ථ හා ව්‍යඤ්ජන සහිත (සාත්ථං සබ්‍යඤ්ජනං), පරිපූර්ණ (කෙවලපරිපුණ්ණං), පිරිසිදු (පරිසුද්ධං) දේශනා කරන්නැයි බුදුන් වහන්සේ විසින් ශ්‍රාවකයන්ට උපදෙස් දී තිබේ (මහාවග්ගපාළි 1, 1983: 42).

සම්මාවාචා උගන්වන පැරණි සූත්‍රයන්හි විරති සමාදාන යන උභයාංශ ම අවධාරණය කෙරේ. බුදුසමයෙහි පදනම හෙවත් ත්‍රිශික්ෂා මාර්ගයේ ශීලයෙහි නියෝජනයක් වන වචනය පිළිබඳ සංවරය භාෂා භාවිතය පිළිබඳ බෞද්ධ විග්‍රහයෙහි වැදගත් අංගයකි. බෞද්ධ ශීලය හුදු විරමණයෙන් පමණක් සම්පූර්ණ නොවේ.

"මුසාවාදය හැර මුසුවාදයෙන් වැළකුණේ වෙයි, සත්‍යය කියනසුලු වූයේ සත්‍යයෙන් සත්‍යය ගළපනුයේ ස්ථිරකථා ඇත්තේ ඇදහිය යුතු බස් ඇත්තේ ලෝකයා බොරුවෙන් නොරවටන්නේ වෙයි. පිසනුබස් හැර සිසුනුබසින් තොර වූයේ වෙයි. මෙතැනින් අසා මොවුන්ගේ භේදය පිණිස එකියන්නේ නොවෙයි. එතැනින් අසා ඔවුන්ගේ භේදය පිණිස මෙතැන කියන්නේ නොවෙයි. මෙසේ බිඳුණුවුන් සමගි කරන්නේ සමගි වූවන්ට අනුබල දෙන්නේ සමගියට කැමැත්තේ සමගියෙහි ඇලුණේ සමගි වූවන් දැක සතුටු වනසුලු වූයේ සමගි කරණ වචන කියන්නේ වෙයි. රළුබස් හැර රළු බස් කීමෙන් වැළකුණේ වෙයි. යම් ඒ වචනයක් නිදොස් ද, කනට සුව ද, ප්‍රේමණීය ද, ළගන්නාසුලු ද, නාගරික ද, බොහෝ දෙනා කැමැති ද, බොහෝ දෙනාගේ මන වඩන්නේ ද, එබඳු වචන කියන්නේ වෙයි. හිස් බස් තෙපලීම හැර හිස් බස් තෙපලීමෙන් වෙන් වූයේ වෙයි. කල් බලා කියනසුලු වූයේ වූවක් කියනසුලු වූයේ අර්ථයක් ම කියනසුලු වූයේ ධර්මයක් ම කියනසුලු වූයේ විනයක් ම කියනසුලු වූයේ වෙයි. ළෙහි තැන්පත් කර ගත යුතු කරුණු සහිත වූ පිරිසිඳීම් ඇති අර්ථයෙන් යුත් වචන නිසි කල්හි කියන්නේ වෙයි " (මජ්ඣිමනිකාය 1, 1964: 436).

යථෝක්ත විවරණයෙන් පැහැදිලි වන්නේ මුසාවාදා, පිසුණාවාචා, පරුසාවාචා හා සම්පප්ඵලාපාවලින් වෙන්වීමෙන් පමණක් නතර නොවී ඊට අදාළ සමාදාන ද පිරිය යුතු බව යි.

බුදුන් වහන්සේ අසත්‍යය අගය නොකළ නමුත් සත්‍යයට ද වඩා සමාජ යහපත අපේක්ෂා කළ බව මජ්ඣිමනිකායේ අභයරාජකුමාර සූත්‍රයෙන් පැහැදිලි කෙරේ. එම දේශනය අවබෝධ කර ගැනීම සඳහා ඊට අදාළ සන්දර්භය ද වටහා ගත යුතු ය. නිගණ්ඨයන්ගේ පෙළඹවීමෙන් බුදුන් වහන්සේ සමග වාදයකට එළඹෙන අභයරාජ කුමාරයා බුදුරදුන්ගෙන් ප්‍රශ්න කරන්නේ ද්වයවාදී චින්තනයක පිහිටාගෙන බව පෙනේ.

නිගණ්ඨයන්ගේ උපදෙස් අනුව ''බුදුන් වහන්සේ අනුන්ගේ හිත රිදෙන සේ කතා කරනවා ද?'' යන ප්‍රශ්නය නිගන කුමාරයා ඊට අස්ත්‍යර්ථවාචී පිළිතුරට එක් ආකාරයකිනුත් නාස්ත්‍යර්ථවාචී පිළිතුරට තවත් ආකාරයකිනුත් ප්‍රතිප්‍රශ්න කිරීමට සූදානම් ව බුදුරදුන් වෙත ගියේ ය. එහෙත් බුදුන් වහන්සේ ප්‍රතිෂේධාත්මක ව හා නිෂේධාත්මක ව පිළිතුරු දීම ප්‍රතික්ෂේප කොට තමන් කතා කරන පිළිවෙළ කෙබඳු දැයි පැහැදිලි කළහ.

1. සිදු නොවූ අසත්‍ය අනර්ථකර අන්‍යයන්ට අප්‍රිය අමනාප වූ වදන් නොබිණීම.
2. සිදු වූ සත්‍ය වූ අනර්ථකර අන්‍යයන්ට අප්‍රිය අමනාප වදන් නොබිණීම.
3. සිදු වූ සත්‍ය වූ අර්ථ සහිත අන්‍යයන්ට අප්‍රිය අමනාප වූ වදන් සුදුසු කල්හි බිණීම.
4. සිදු නොවූ අසත්‍ය වූ අනර්ථ සහිත අන්‍යයන්ට ප්‍රියමනාප වූ වදන් නො බිණීම.
5. සිදු වූ සත්‍ය වූ අනර්ථ සහිත අන්‍යයන්ට ප්‍රියමනාප වූ වදන් නොබිණීම.
6. සිදු වූ සත්‍ය වූ අර්ථ සහිත වූ අන්‍යයන්ට ප්‍රියමනාප වූ වදන් සුදුසු කල්හි බිණීම (මජ්ඣිමනිකාය 2, 1973: 96 ).

බුදුන් වහන්සේ භාෂා භාවිතයේ දී සත්‍යයට හා අන්‍යයන්ගේ සිත සතුටු වීමට ද වඩා භාෂා භාවිතයෙහි අර්ථ සහිත හා අනර්ථ සහිත බව අවධානයට ගෙන තිබේ. එබැවින් සත්‍යය ම ප්‍රකාශ කළ යුතු ය! යන අදහසක් අන්‍යයන්ගේ සිත නොරිදෙන සේ කතා කළ යුතු ය යන්නත් බුදුසමයෙන් ප්‍රතික්ෂේප වේ. අභයරාජ කුමාරයාගේ ඇකයෙහි සිටි දරුවාගේ මුවට ගල් කැටයක් වැටුණු පසු කරන්නේ කුමක් දැයි ප්‍රශ්න කළ බුදුන් වහන්සේට එය ඉවත් කරන බවත් එහි දී ඇතිවන වේදනාවන් සලකන්නේ දැයි ප්‍රශ්න කළ බුදුන් වහන්සේට එය නොසලකන බව කුමාරයා පැවසී ය (මජ්ඣිමනිකාය 2, 1973: 96).

බෞද්ධ සංස්කෘත මහාකවියා වූ අශ්වඝෝෂ ස්වකීය සෞන්දරනන්ද මහාකාව්‍යයෙහි බුදුන් වහන්සේ නන්ද පැවිදි කිරීම පිණිස කරනු ලබන අනුශාසනය ද මීට සමාන කරයි. දරුවාගේ මුවට වන් ගල් කැටය නිසා වන කුඩා වේදනා අමතක කොට එය මුවින් ඉවත් කරන කිරි මවක මෙන් රාග හුල් උදුරා දැමීම පිණිස, හිත පිණිස රළු බසක් කියන බව බුදුන් වහන්සේ නන්දට කියති (සෞන්දරනන්ද මහා කාව්‍ය, 1994: 63 ).

භාෂා භාවිතයේ දී අනුගමනය කළ යුතු උපදෙස් පහක් අංගුත්තරනිකායේ උදායි සූත්‍රයෙහි දක්නට ලැබේ.

1. නිරවුල් ව පිළිවෙළින් ඉදිරිපත් කරන්න **(ආනුපුබ්බිකථං)**
2. හේතු උදාහරණ දක්වමින් කරුණු දක්වන්න **(පරියායදස්සාවී)**

3. දුකට පත් සත්වයින් දුකින් මිදවීමේ කරුණාවෙන් කථා කරන්න
   **(අනුද්දයතං පටිච්ච)**
4. වාසි බලාපොරොත්තුවෙන් කථා නොකරන්න
   **(න ආමිසන්තරො)**
5. තමන් හා අනුන් නොගටා කථා කරන්න
   **(අත්තානං ච පරං ච අනුපහච්ච)** (අඞ්ගුත්තරනිකාය 3, 1968: 300 පිට)

මෙම උපදෙස්වලින් ද ඉතා පැහැදිලි ව ප්‍රකට කෙරෙන්නේ බුදුසමය අන් කරුණු පිළිබඳ ව මෙන් ම භාෂා භාවිතයේ දී ද එහි අරමුණ පිළිබඳ ගැඹුරින් අවධානයට ගන්නා බව යි. ආත්මාර්ථය පෙරටු කොට ගත්, සමස්ත සමාජය කෙරෙහි දයානුකම්පාවෙන් තොර, පටු ලාභාපේක්ෂාවෙන් භාෂාව භාවිත කිරීම සමාජය සුවපත් කිරීමට යොදාගත හැකි මානවයා සතු භාෂා සම්පත වැරදි ලෙස නියෝජනය කිරීමක් වන්නේ ය.

මෙහි එන පළමු කරුණු දෙක සන්නිවේදනය කෙරෙන කරුණ හා බැඳෙන අතර අනෙක් තුන බොහෝදුරට සන්නිවේදකයා හා බැඳේ. කරුණු නිරවුල් ව හා පිළිවෙළින් ඉදිරිපත් කිරීමත් හේතු උදාහරණ දක්වමින් කරුණු දැක්වීමත් අසන්නාට ප්‍රවෘත්තිය මැනවින් ග්‍රහණය කර ගැනීමට බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. සෙසු කරුණු තුනෙන් එම ප්‍රවෘත්තිය ඉදිරිපත් කිරීමේ දී පැවතිය යුතු අරමුණුවල ස්වභාවය ඉස්මතු කෙරේ. එහිලා කාරුණික භාවය, වාසි බලාපොරොත්තු නොවීම ප්‍රවෘත්තියෙහි පවත්නා යථා ස්වරූපය ආරක්ෂා කර ගැනීමට හේතුවේ.

සිව්පිළිසිඹියා (චතුපටිසම්භිදා) සංකල්පය ද භාෂාව විග්‍රහය හා බැඳෙන බැවින් ඒ පිළිබඳ ව ද කෙටියෙන් හෝ අවධානයට ලක් විය යුතු ය. අත්ථපටිසම්භිදා (ප්‍රකාශනය), ධම්මපටිසම්භිදා (අර්ථය), නිරුත්තිපටිසම්භිදා (සන්නිවේදනය) හා පටිභානපටිසම්භිදා (අවබෝධ කර ගැනීම) ලෙස මූලික වශයෙන් දැක්විය හැකි අතර නිරුත්තිපටිසම්භිදා විවරණය කරන විසුද්ධිමග්ගය **එකසත වොහාර කුසලතා** යනු;

"පුබ්බයොගො බාහුසච්චං දෙසභාසා ච ආගමො
පරිපුච්ඡා අධිගමො ගරුසන්නිස්සයො තථා
මිත්තසම්පත්ති චෙ වාපි පටිසම්භිදපච්චයී" (විසුද්ධිමග්ග, 1919: 331)

දේශීය භාෂා සියයක දැනුමකින් යුක්ත වීම යැයි දක්වා තිබේ. මෙහි සංඛ්‍යාත්මක කරුණ අමතක කළහොත් භාෂා කිහිපයක කුසලතාව නිරුක්තිපටිසම්භිදාලාභී රහතුන්ට තිබෙන්නට ඇතැයි සැලකීමේ හැකියාව තිබේ.

බෞද්ධ විග්‍රහය අනුව භාෂාව මනෝවිද්‍යාත්මක පදනමක පවතී. දිනක් ධම්මදින්නා තෙරණිය වෙත පැමිණි විසාඛ උපාසකයා සංස්කාර කී වැදෑරුම්ද යි ප්‍රශ්න කළේ ය. කාය සංඛාර, වාචීසංඛාර, මනෝසංඛාර යැයි සංස්කාර තෙවැදෑරුම් යැයි ඇය පිළිතුරු දුන්නා ය. වචී සංඛාර යනු විතක්ක හා විචාර බව ද භාෂාව බිහිවන්නේ විතර්කයෙන් (කල්පනා කොට) හා විචාරයෙන් (සිතා බලා) පසුව බව ද එහි විස්තර වේ **(පුබ්බෙ ඛො ආවුසො විසාඛ, විතක්කෙත්වා විචාරෙත්වා පච්ඡා වාචං භින්දති, තස්මා විතක්කවිචාරා වචීසංඛාරො)** (මජ්ඣිමනිකාය 1, 1964: 708).

අරමුණ කරා යන අරමුණට නගින ස්වභාවය විතක්ක නම් වන අතර පැමිණි අරමුණ පිරිමදින ස්වභාවය විචාර නමින් ද හැඳින් වේ. විතක්විචාර ද්වය ම ප්‍රථම ධ්‍යානයේ දී දක්නට ලැබෙන අතර ඉන් ඉහළ ධ්‍යානයන්හි දක්නට නො ලැබේ. විතර්කය ඝණ්ඨාවකට පළමුවෙන් ගැසීමෙන් නිකුත් වන නාදය මෙන් ද විචාරය එම නාදයෙන් ම නිකුත් වන අනුනාදය ලෙස ද සැලකිය හැකි ය. විතක්කවිචාර Inner Speech ලෙස Buddhist Dictionary ය දක්වයි (Nayanatiloka, 1988: 239). කායික සහ වාචසික ක්‍රියා බිහිවන්නේ මනස පූර්වාංගම කොට බව ධම්මපදයේ පළමු ගාථාද්වයෙන් ම කියැවේ. (The Dhammapada, 1985: 10).

## නිගමනය

බුදුසමයෙහි භාෂාව සම්මුතියක් ලෙස සලකනු ලැබේ. එසේ ම භාෂවක පවත්නා විශේෂතා සැලකිල්ලට ගනිමින් එක් භාෂාවක් තවත් භාෂාවකට වඩා උසස් හෝ පහත් ලෙස තීරණය නොකෙරේ. භාෂාව එකිනෙකාගේ අදහස් හුවමාරු කෙරෙන උපකරණයක් බැවින් එයින් අපේක්ෂිත අරමුණ වූයේ කෙනෙකු ප්‍රකාශ කරන අදහස තවෙකෙකු වෙත රැගෙන යාමයි. එය හුදු මානවයා සතු උපකරණයක් සේ පමණක් සැලකීමට බුදුසමය එකඟ නොවන බව ඇතැම් සූත්‍රවල පෙනෙන කරුණුවලින් සනාථ වේ. බුදුන් වහන්සේගේ සමස්ත ඉගැන්වීම්හි අරමුණ පුද්ගලයාගේ පරම යහපත බැවින් භාෂාවෙන් ද අපේක්ෂා කරන ලද්දේ එය ම බව විශේෂයෙන් සඳහන් කළ යුතු නොවේ. උන්වහන්සේ සත්‍යයට ද වඩා පුද්ගල යහපත සැලකිල්ලට ගැනීමෙන් මෙය මොනවට ප්‍රකට වේ. ගැටුම් ප්‍රභවයෙහි ලා ප්‍රමුඛ සාධකයක් සේ සලකන භාෂා පරාමර්ශනය ප්‍රතික්ෂේප කරන බුදුසමය පොදු ව්‍යවහාරය නොඉක්මවා භාවිත කළ යුතු බවට නිර්දේශ කරයි.

## පරිශීලිත මූලාශ්‍රයෝ

අඞ්ගුත්තරනිකාය 1, (1960) බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, කොළඹ: ලංකාණ්ඩුවේ ප්‍රකාශනය.

අඞ්ගුත්තරනිකාය 3, (1968) බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, කොළඹ: ලංකාණ්ඩුවේ ප්‍රකාශනය.

කාටර්, ජෝන් රෝස් (1999) ධම්ම, පරි. ඩබ්ලිව්. එස්. කරුණාතිලක, කොළඹ 11: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

චුල්ලවග්ගපාළි 1, (1983) බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, කොළඹ: ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ප්‍රකාශනය.

ථේරගාථාපාළි, (1972) බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, කොළඹ: ලංකාණ්ඩුවේ ප්‍රකාශනය.

දීඝනිකාය 1, (1962) බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, කොළඹ: ලංකාණ්ඩුවේ ප්‍රකාශනය.

දීඝනිකාය 2, 3, (1976) බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, කොළඹ: ශ්‍රී ලංකා ජනරජ ප්‍රකාශනය.

බලගල්ලේල විමල්, ජී. (1995) භාෂා අධ්‍යයනය හා සිංහල ව්‍යවහාරය කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

මජ්ඣිමනිකාය 1, (1964) බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, කොළඹ: ලංකාණ්ඩුවේ ප්‍රකාශනය.

මජ්ඣිමනිකාය 2, (1973) බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, කොළඹ: ලංකාණ්ඩුවේ ප්‍රකාශනය.

මජ්ඣිමනිකාය 3, (1974) බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, කොළඹ: ලංකාණ්ඩුවේ ප්‍රකාශනය.

මහාවග්ගපාළි 1, (1957) බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව, කොළඹ: ලංකාණ්ඩුවේ ප්‍රකාශනය.

සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා (1948) (සංස්) වැලිවිටියේ සෝරත හිමි, වැලිවිටියේ පේමරතන හිමි, කොළඹ: සයිමන් හේවාවිතාරණ ප්‍රකාශනය.

සෞන්දරනන්ද මහා කාව්‍ය 5, 6 සර්ග, (1994) (සංස්) කැස්බෑවේ විමලානන්ද හිමිල කැස්බෑව: නන්දන ප්‍රකාශන.

Encyclopedia of Britanca, (1970) 'Language, Tokyo: Willian Benton Publisher, v.13.

Horner, I.B. (Tr) (1975) The Book of the Discipline, (Vinayapiñaka) London: The Pâli Text Society, v. V.

# සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය

පස්වැනි කලාපය 2009 ජනවාරි

ප්‍රථම භාගය

ජනගහනය වියපත් වීම සහ එහි සමාජීය-ආර්ථික ප්‍රතිවිපාක (ශ්‍රී ලංකාවට විශේෂ අවධානය සහිත ව)
ජේ.එම්.පී. පතිරගේ 1-21

ශ්‍රී ලංකාවේ සංවර්ධන පරිපාලනය දේශපාලනීකරණය වීමේ ක්‍රියාවලිය පිළිබඳ විමසීමක්
ශකිලා සමරකෝන් 23-34

ග්‍රාමීය වී ගොවිතැන නවීකරණය වීම සහ සමාජ ආර්ථික වෙනස්වීම්: සමාජ විද්‍යාත්මක විශ්ලේෂණයක්
ආර්.එම්. සුසන්ත රස්නායක 35-52

ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම්: කොළඹ මැගසින් කාන්තා බන්ධනාගාරය ඇසුරින් කරන ලද අධ්‍යයනයක්
එච්. රංජිත් සහ රවීන්ද්‍ර චන්ද්‍රසිරි පල්ලියගුරුගේ 53-74

ලාංකීය සිංහල ගුවන්විදුලි නාට්‍යයේ මුල්කාලීන ස්වරූපය පිළිබඳ ව අප්‍රකට තොරතුරු සමුදායක්
සේන නානායක්කාර 75-88

නායයෑම් සමග ජීවත්වීමේ දී නාය පූර්ව ලක්ෂණවල ඇති වැදගත්කම
පී.එච්. අමරවීර 89-109

කුඩා වැව් ගම්මානවල සමාජ ආර්ථික සංවර්ධනය කෙරෙහි වැව් ප්‍රතිසංස්කරණයේ බලපෑම් (ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරෙනි)
කේ.පී.එල්. නිශාන්ත පටබැඳි 111-132

ලාංකේය බෞද්ධ කාන්තා පැවිදිභාවය පිළිබඳ විමර්ශනයක්ඵ මාතෘත්වය සහ භාර්යාභාවයෙන් ඔබ්බෙහි වන ස්ත්‍රීත්වය
ගිහානි ද සිල්වා 133-152

ශ්‍රී ලංකාවේ කුල ක්‍රමය සහ ඉඩම් භුක්තිය පිළිබඳ සමාජ-මානව විද්‍යාත්මක විග්‍රහයක් (නෙළුව 'මැදගම' ග්‍රාමය ආශ්‍රයෙනි)
දිලාන් ගුණවර්ධන 153-173

බෞද්ධ දර්ශනයේ භාෂා අධ්‍යයන චින්තනය
විමල් හේවාමානගේ 175-190

ISSN: 1800 - 1459

**National Digitization Project**

***National Science Foundation***

Institute : Sabaragamuwa University of Sri Lanka

1. Place of Scanning : Sabaragamuwa University of Sri Lanka, Belihuloya
2. Date Scanned : ..2017-10-02............................................
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : ...S. A. C. Sadaruwan.........................................

Signature : ..........................................................

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : LIBRARIAN.....................................................

Name : T.N. NEIGHSOOREI.....................................................

Signature : .......................................................

Date : ..2017-10-02.........

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*